Learning Resource Center
R
De Mazenod College
Kandana

# ද මැසිනොද් විදුහල - කඳාන

# De Mazenod College – Kandana

## ඉතිහාසය I

2024 . 06

**පළමුවන වාර පරීක්ෂණය - 2024** **10 ශ්‍රේණිය**

**පැය 01 යි**

සැලකිය යුතුයි

- *සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න*
- *අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න*

1) ශ්‍රී ලංකාවේ දේශිය සාහිත්‍ය මූලාශ්‍රය අතර වඩාත් පැරණිතම කෘතිය ලෙස සැලකෙන්නේ,
   1. දීපවංසයයි.
   2. චූලවංසයයි.
   3. මහාවංසයයි.
   4. බෝධිවංසයයි.

2) මහාවංසයේ මුල් කොටස රචනා කරනු ලැබුවේ,
   1. අනුරාධපුර දික්සඳ සෙනෙවියා පිරිවෙනේ විසූ මහානාම නම් භික්ෂුව විසිනි.
   2. මාතලේ අලුවිහාරයේදී බුද්ධඝෝෂ හිමියන් විසිනි.
   3. අභයරාජ පරිවේණාධිපති වල්ගම්පාය මහතෙරුන් විසිනි.
   4. මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමියන් විසිනි.

3) මහාවංසයේ ඇතැම් කොටස් අර්ථ විවරණය සඳහා සම්පාදනය කරනු ලැබූ අටුවා ග්‍රන්ථය කුමක්ද?
   1. රසවාහිනිය
   2. රාජරත්නාකරය
   3. නිකාය සංග්‍රහය
   4. වංසත්ථප්පකාසිනී

4) පහත **A** තීරුවේ ඇති සාහිත්‍ය මූලාශ්‍රය අතර **B** තීරුවේ ග්‍රන්ථ හා ගැළපූ විට ලැබෙන පිළිතුරු වරණය තෝරන්න.

| A | | B | |
|---|---|---|---|
| i. | ප්‍රශස්ති කාව්‍ය | A | සැළලිහිණි සංදේශය |
| ii. | සංදේශ කාව්‍ය | B | පැරකුම්බා සිරිත |
| iii. | හටන් කාව්‍ය | C | ථූපවංසය |
| iv. | වංස කථා | D | කොන්ස්තන්තීනු |
| | | E | ලෝවැඩ සගරාව |

   1. ABCD
   2. BADC
   3. BAED
   4. CBAE

5) බෞද්ධ රාජධානි පිළිබඳ විස්තර දැක්වෙන දේශාටන වාර්තාව අයත් වන මූලාශ්‍රය කුමක්ද?
   1. අරාබි මූලාශ්‍රය
   2. පෘතුගීසි මූලාශ්‍රය
   3. චීන මූලාශ්‍රය
   4. ඕලන්ද මූලාශ්‍රය

6) කැටපත් පවුරු ගී (සීගිරි ගී) අයත් වනුයේ ද අභිලේඛනයන්ටය. එය ලියා ඇති මාධ්‍ය කුමක්ද?
   1. තඹ තහඩු
   2. දැව
   3. මැටි පුවරු
   4. බිත්ති

7) පහත **A** තීරුවේ ඇති සාහිත්‍ය මූලාශ්‍රය අතර **B** තීරුවේ ග්‍රන්ථ හා ගැළපූ විට ලැබෙන පිළිතුරු වරණය තෝරන්න.

| | A | | B |
|---|---|---|---|
| i. | හියුං සියැං | A | නැචුරාලිස් හිටෝරියා |
| ii. | ප්ලිනි | B | භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය |
| iii. | ඇරිස්ටෝටල් | C | භික්ෂුවගේ දේශාටන වාර්තා කෘතිය |
| iv. | ටොලමි | D | ඩිමුන්ඩෝ කෘතිය |
| | | E | ඉන්ඩිකා කෘතිය |

1. ABCD    2. BADC    3. BAED    4. CBAE

8) පුරාණ කාලයට අයත් සාහිත්‍ය, ආගමික තොරතුරු හා වංසකථා බහුල වශයෙන් ලිය වී ඇත්තේ,
1. සෙල්ලිපිවලය.    2. මැටි පුවරුවලය.
3. පුස්කොළ පොත්වලය.    4. තඹ හා රන් තහඩු වලය.

9) මෙරට ශාසන ඉතිහාසය පිළිබඳ තොරතුරු ඇතුළත් වන කෘතිය කුමක්ද?
1. රාජාවලිය    2. නිකාය සංග්‍රහය
3. දීපවංසය    4. සමන්තපාසාදිකාව

10) හක්ගෙඩිය, ගොන්කුරය, ඇත් අඩිය වැනි රූප සටහන් මගින් පෙන්නුම් කරන්නේ,
1. පැරණි කැටයම් කිහිපයක් ය.    2. පැරණි නිත්දගම් මායිම් ය.
3. පැරණි ප්‍රාදේශිය මායිම් ය.    4. පැරණි පුරා වස්තු පිළිබඳ සලකුණු ය.

11) ගල් තලා මත ලියා ඇති අභිලේඛන හඳුන්වනු ලබන්නේ කිනම් නමකින් ද?
1. ගිරි ලිපි    2. ලෙන් ලිපි    3. ටැම් ලිපි    4. පුවරු ලිපි

12) නාණක විද්‍යාව විෂයයෙන් හදාරනු ලබන්නේ මින් කුමක් පිළිබඳව ද?
1. ලෝහ කර්මාන්තය    2. වාස්තු විද්‍යාව
3. කුඹල් කර්මාන්තය    4. පැරණි කාසි

13) ක්‍රි.ව පස්වන ශතවර්ෂයේ දී ශ්‍රී ලංකාවේ විසූ රාජකීය කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම් හා විලාසිතා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඉවහල් වන්නේ කවරක් ද?
1. සීගිරි පර්වතයෙහි ඇඳ ඇති කාන්තා රූප
2. පුරාවිද්‍යාත්මක කැනීම්වලින් හමුවූ ආභරණ කොටස්
3. පොළොන්නරුවේ තිවංක පිළිමගෙයි ඇති චිත්‍ර සටහන්
4. මහනුවර දළදා මාලිගාවේ ඇති චිත්‍ර

14) ශ්‍රී ලංකාවේ ජාතික උරුමයක් වූ පුරාවස්තු රැක ගැනීම කළ යුතු වන්නේ මින් කවර කරුණක් නිසා ද?
1. මතු පරපුරට පෙන්විය යුතු නිසාය.
2. ශ්‍රී ලාංකික අනන්‍යතාව පෙන්නුම් කිරීමට හේතු වන නිසා ය.
3. සංචාරක ව්‍යාපාරයේ වර්ධනයට හේතු වන නිසා ය.
4. අතීත පාලකයන්ගේ කටයුතු ගැන අවබෝධයක් ලබා ගත හැකි නිසාය.

15) තමන් විසින් නොදුටු වෙනත් අය විසින් පවසන ලද තොරතුරු මත පිහිටා ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තා තැබුවෙකු වන්නේ,

1. ෆාහියන් හිමි
2. ක්වෙරෝස්
3. ඉබන් බතුතා
4. රොබට් නොක්ස්

16) ලෙන් ලිපි හෙවත් කටාරම් ලිපිවල වැඩි වශයෙන් දැක්වෙනුයේ,

1. රජවරුන් පිළිබඳ තොරතුරු ය.
2. රජයේ ආඥා පිළිබඳ තොරතුරු ය.
3. ලෙන් පිදූ පුද්ගලයන් ගැනය.
4. ආරෝග්‍යශාලා සඳහා ඉඩම් ප්‍රදාන ගැනය.

17) පුරවැසියෙකු ලෙස ඉතිහාස දැනුම වඩාත් ම ඵලදායි ලෙස භාවිත කළ යුතු වන්නේ,

1. අතීත ශ්‍රී ලාංකික ශ්‍රී විභූතිය හැදෑරීම සඳහා ය.
2. පැරණි තාක්ෂණික දැනුම නවීකරණය කර භාවිතයට ගැනීම සඳහා ය.
3. අතීතයේ කළ වැරදි නැවත සිදු නොකිරීම සඳහාය.
4. අතීතය තුළින් වර්තමානය අවබෝධ කරගෙන අනාගතය හැඩගසා ගැනීම සඳහා ය.

18) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය වශයෙන් සැලකෙන ගල් යුගය වශයෙන් හඳුන්වන්නේ අදින් වසර කොපමණ කාලයකට පෙරද?

1. වසර අසූ දහසකට
2. වසර තිස් අටදහසකට
3. එක් ලක්ෂ පනස්දහසකට
4. එක් ලක්ෂ විසිපන්දහසකට

19) ශ්‍රී ලංකාවේ අර්ධ ශුෂ්ක කලාපයේ පොළොවේ මැටි සහිත වැලි පසකින් වැසුණු බොරලු තට්ටුවක් තිබෙන ස්ථානය පුරාවිද්‍යාඥයින් විසින් හඳුන්වා තිබෙන්නේ,

1. මැණික් ඉල්ලම් යන නමිනි.
2. වැලි කඳු නිධි යන නමිනි.
3. ඉරණමඩු සැකැස්ම යන නමිනි.
4. යපස් සංචිතය යන නමිනි.

20) ශ්‍රී ලංකාව ජනාවාස කරන ලද්දේ, ආදි කාලීන,

1. හෝමෝ නියැන්ඩතාල් මානවයා විසිනි.
2. හෝමෝ ඉරෙක්ටස් මානවයා විසිනි.
3. හෝමෝ සාපියන් මානවයා විසිනි.
4. හෝමෝ හැබිලිස් මානවයා විසිනි.

21) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූයේ යැයි පුරා විද්‍යාත්මක සාක්ෂි මගින් හඳුනාගෙන ඇත. තෙත් කලාපීය එළිමහන් වාසස්ථානයට නිදසුනකි.

1. පාහියන්ගල ලෙන
2. කුරුවිට බටදොඹලෙන
3. කිතුල්ගල බෙලිලෙන
4. බෙල්ලන් බැඳි පැලැස්ස

22) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි ගනේකන්ද විහාරයේ සහ ගල්ලෙන විහාරයේ තිබෙන ගල් ගුහා දෙකක කොටා ඇති බ්‍රාහ්මී සෙල්ලිපිවල "ආවරණ" යන වචනය දක්වා ඇත. එහි අදහස,

1. පර්වතය
2. වැව
3. අමුණ
4. කමත

23) උඩරංචාමඩමේ කැනීම්වලින් හමු වූ මැටි බඳුන් කොටස්වලට සමාන මැටි බඳුනක කැබලි හමු වූ තවත් ස්ථානයක් වන්නේ,

1. ඉබ්බන්කටුව
2. බෙරගල
3. හල්දුම්මුල්ල
4. හෝර්ටන් තැන්න

24) පහත දැක්වෙන්නේ ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් වෘත්තිකයන් හා ඔවුන් විසූ ජනාවාසයි A හා B ගැළපූ විට පිළිතුර කුමක්ද?

| | A | | B |
|---|---|---|---|
| i. | කසිකාරගාම | A | ධීවරයන් විසූ ගම් |
| ii. | මණිකාරගාම | B | වඩුවන් විසූ ගම් |
| iii. | කේවට්ටගාම | C | ගොවියන් විසූ ගම් |
| iv. | කුම්භකාරගාම | D | මැණික් ගැරූ හෝ මැණික් කැපූ අය ජීවත් වූ ගම් |
| | | E | වළං සාදන්නන් විසූ ගම් |

1. CDAE
2. BADC
3. ABCE
4. DABE

25) පළමුවන විජයබාහු රජතුමාට අයත් පනාකඩුව තඹ සන්නසේ "නුරුපුර" යන වචනයෙන් ව්‍යවහාර කර ඇති නගරය කුමක්ද?

1. යාපහුව
2. පොළොන්නරුව
3. අනුරාධපුරය
4. මාගම

26) අතීතයේ ජනතාව විසින් අතහැර දැමූ ගම්මාන හැඳින් වූ නම කුමක්ද?

1. පට්ටනගාම
2. නියම්ගම්
3. ඔළගම්
4. කඩහවාපීගාම

27) පූර්ව ඓතිහාසික යුගයේ ස්ථිරවාසීතාවය සඳහා තොරතුරු සොයාගත් ස්ථානයක් වන්නේ,

1. බෙරගල
2. උඩරංඩාමඩම
3. තිස්සමහාරාමය
4. තිකවලමුල්ල

28) මුල් ඓතිහාසික යුගයේ මූලික ජනාවාස වියළි කලාපයේ ව්‍යාප්ත වීමට හේතු වුයේ මින් කුමක්ද?

1. වියළි දේශගුණයක් පැවතීමයි.
2. ජලය ප්‍රමාණවත් ලෙස පැවතීමයි.
3. රතු දුඹුරු පස්වල ව්‍යාප්තියයි.
4. ගම් වැව් වල ව්‍යාප්තියයි.

29) ප්‍රාග් ඓතිහාසික යුගයේ නමා වකුටු කරන ලද මිනිස් ඇටසැකිලි වල සාක්ෂි හමුවූ ස්ථානය කුමක්ද?

1. පාහියන්ගල ලෙන
2. රාවණා ඇල්ල
3. කුරුවිට බටදොඹලෙන
4. කිතුල්ගල බෙලිලෙන

30) පූර්ව ඓතිහාසික යුගයට අයත් මැටි ඔරු සුසානයක් වන්නේ මින් කුමක්ද?

1. රංචාමඩම සුසාන භූමිය
2. ඉබ්බන්කටුව සුසාන භූමිය
3. යටිගල් පොත්ත සුසාන භූමියය
4. යාපහුවේ ගල් සොහොන් කනත්ත

31) ශ්‍රී ලංකාවේ යකඩ භාවිත කළ බවට මුල්වරට පැහැදිලි පුරාවිද්‍යාත්මක සාධක හමුවන්නේ,

1. ප්‍රාග් ඓතිහාසික යුගය
2. පූර්ව ඓතිහාසික යුගය
3. මුල් ඓතිහාසික යුගය
4. ඓතිහාසික යුගය

32) මුල් ඓතිහාසික යුගයේ ගංගා නිම්නවලට පිටතින් ව්‍යාප්ත වූ ජනාවාසවල වැසියන් සිය යැපීම් ක්‍රමය ලෙස අනුගමනය කරන ලද්දේ,

1. සත්ව පාලනයයි.
2. හේන් ගොවිතැනයි.
3. කුඹුරු ගොවිතැනයි.
4. වෙළෙඳාමයි.

Learning Resource Center R De Mazenod College Kandana

# ද මැසිනෝද් විදුහල - කඳාන
# De Mazenod College – Kandana

## ඉතිහාසය II

2024.06

පළමුවන වාර පරීක්ෂණය - 2024

10 ශ්‍රේණිය

පැය 03 යි

සැලකිය යුතුයි
- *I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.*
- *II කොටසින් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.*
- *පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.*

### I කොටස

1) (අ) පහත අංක (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකාවේ සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම ඔබට සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කොට නම් කරන්න.

i. මහාතිත්ථ, මිහින්තලේ, බුන්දල, කිරිඳි ඔය, කළු ගඟ, ඉරණමඩු ජලාශය, කලා වැව, දෙවුන්දර, දඹකොළ පටුන, දැදුරු ඔය, අනුරාධපුරය, මහනුවර (ලකුණු 12 යි)

ii. රතු මුහුද, බෙංගාල බොක්ක, පර්සියානු බොක්ක, අරාබිය, චීනය, ඉතාලිය (ලකුණු 06 යි)

(ආ) පහත A, B, C, D යනුවෙන් දක්වා ඇති ඓතිහාසික සිද්ධීන් හා සම්බන්ධ නිවැරදි පිළිතුරු අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A. එළා හෙළදිව කෘතිය රචනා කරන ලද විදේශිකයා
B. ගල්පොත සෙල්ලිපිය කර වූ රජතුමා
C. ඓතිහාසික මූලාශ්‍රවල වෙළෙඳගම් හඳුන්වා ඇත්තේ
D. තිස්සමහාරාම වැව ඉදි කරවන ලද රජතුමා (ලකුණු 04 යි)


- A හා B වලින් දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට ආසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A රූපය



1. A රූපයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න.
2. මොහු කුමන ජාතිකයෙක් ද?
3. ජීවත් වූයේ කොහේද?
4. මොහු විසින් රචිත භූගෝල විද්‍යා ග්‍රන්ථය කුමක්ද?

B රූපය



1. B වලින් දැක්වෙන පින්තූරය නම් කරන්න.
2. එය සොයාගන්නා ලද්දේ කොහෙන්ද?
3. මෙමගින් කිනම් තාක්ෂණයක් පිළිබිඹු වන්නේ ද?
4. මෙය නිර්මාණයට යොදා ගෙන ඇති උපකරණය කුමක්ද?

## II කොටස

**2)**

**1.** මහාවංසය ලිවීමට ආභාසය ලබාගත් ග්‍රන්ථ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

**2.** පහත A, B, C සහ D ඇසුරෙන් අසා ඇති තොරතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. පතාකඩුව තඹ සන්නස කරවන ලද පොළොන්නරු පාලකයා

B. මහාවංසයට ලියන ලද ටීකාව

C. මහාවංසයේ මුල් කොටස රචනා වී අවසන් වන රාජ්‍ය සමය

D. ලංකාවේ පැරණිතම ශිලා ලිපි හැඳින් වූ නම (ලකුණු 04 යි)

**3.** ඉතිහාසය ගොඩනැගීමේ දී ශිලා ලිපි වැදගත්වන ආකාරය කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**4.** ඉතිහාසය ඉගෙනීමෙන් ලද හැකි ප්‍රයෝජන **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

**3)**

**1.** ශ්‍රී ලංකාව ගැන තොරතුරු සඳහන් කරන දකුණු ඉන්දියානු ග්‍රන්ථ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

**2.** ඉතිහාසය ගොඩනැගීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය භාවිත කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

**3.** ඉතිහාසය ඉගෙන ගැනීම සඳහා කාසි උපයෝගී කරගත හැකි ආකාරයන් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

**4.** පුරාවස්තු විනාශ වීමට බලපාන මානව ක්‍රියාකාරකම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

**4)**

**1.** ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මානවයා ජීවත් වූ පරිසර කලාප **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

**2.** ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ කැපී පෙනුණු ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

**3.** ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත් වූවකු මිය ගිය විට අනුගමනය කරන්නට ඇතැයි සැලකෙන අවමංගල්‍ය චාරිත්‍ර විධි මොනවාදැයි කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**4.** පූර්ව ඓතිහාසික මානවයා තම කටයුතු සඳහා යොදා ගත් තාක්ෂණය කරුණු **තුනක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

**5)**

**1.** ප්‍රාග් ඓතිහාසික මානවයන් මෙවලම් තැනීම සඳහා භාවිත කළ පාෂාණ වර්ග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

**2.** ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාරය සඳහා ගත්

A. සත්ව ආහාර **දෙකක්** ද

B. ශාක ආහාර **දෙකක්** ද අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

**3.**

A. පූර්ව ඓතිහාසික යුගය යනුවෙන් සැලකෙනුයේ කවර කාලපරිච්ඡේදයක්ද?

B. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන භූමි පිහිටි ස්ථාන **තුනක්** දක්වන්න. (ලකුණු 05 යි)

**4.** මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

6)

1. ගල් යුගයට අයත් මානවයාගේ ජනාවාසවල මූලික ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
2. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ
   - A. තෙත් කලාපීය ලෙන් වාසස්ථාන **දෙකක්** ද
   - B. වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන **දෙකක්** ද අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 04 යි)
3. මුල් ඓතිහාසික යුගයේ ජනතාවගේ ප්‍රධාන යැපීම් ක්‍රමය පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
4. මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යුහය හා ස්වරූපය පිළිබඳව කරුණු **තුනක්** ලියා විස්තර කරන්න. (ලකුණු 06 යි)

7)

1. පූර්ව රාජ්‍ය සමයේ පරිපාලන යාන්ත්‍රණය තුළ සිටි ප්‍රධාන නිලධාරීන් **තිදෙනා** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
2. ගමෙහි ප්‍රධානියා විසින් ඉටු කරන ලද කාර්යයන් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
3.
   - A. වැව් පද්ධති තුළින් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වූ අරමුණු **දෙකක්** ද
   - B. පරුමකගේ කාර්යයන් **තුනක්** ද සඳහන් කරන්න. (ලකුණු 05 යි)
4. පණ්ඩුකාභය රජුගේ වැදගත්කම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)